# <u>Work Flow Video on Community Vaccination Centre (translated script)</u>

<u>ප්‍රජා එන්නත් කිරීමේ මධ්‍යස්ථානයේ කාර්ය භාරය පිළිබඳ වීඩියෝව (පරිවර්තනය කළ පිටපත)</u>

| | හඬ කැවීම | **Voice-Over** |
|---|---|---|
| 1 | මහජනතාවට COVID-19 එන්නත් ලබා දීම සඳහා, රජය විසින් හොංකොං හි දිස්ත්‍රික්ක 18 ම ආවරණය වන පරිදි ප්‍රජා එන්නත් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. පළමු හා දෙවන එන්තත් මාත්‍රාවන් ලබා දෙන ස්ථානය සහ වේලාවන් දැන ගැනීම සඳහා නම් කරන ලද වෙබ් අඩවියේ පැය 24 පුරා ක්‍රියාත්මක ලියාපදිංචි කිරීමේ පද්ධතිය මගින් වේලාවක් වෙන් කර ගැනීම සිදු කළ යුතුය. | The Government will set up Community Vaccination Centres in all 18 districts in Hong Kong to provide COVID-19 vaccinations for members of the public. People must make a reservation on the designated website's 24-hour booking system for the time and location of their vaccinations for both the first and second doses. |
| 2. | **වයස්ගත පුද්ගලයින් හට රැක බලා ගන්නන් දෙදෙනෙකුට නොඅඩු ගණනක් රැගෙන ආ හැකි ය.<br>රැකබලා ගන්නන් ද එන්නත ලබා ගැනීමට කැමති නම්, ඔවුන්ටද  එකවර වේලාවන් වෙන්කරවා ගත හැකිය.** | Elderly people can be accompanied by not more than two carers. If the carers also wish to be vaccinated, they can make their bookings at the same time. |
| | වයස අවුරුදු 70 හෝ ඊට වැඩි | Aged 70 or above |

| | | |
|---|---|---|
| 3. | සාර්ථක වෙන් කරවා ගැනීමකින් පසුව, තහවුරු කිරීමේ දැන්වීමක් වෙබ් අඩවියෙහි දැක්වෙනු ඇත. එමෙන්ම, ඔබගේ ජංගම දුරකතනයට කෙටි පණිවිඩයක් ද ලැබෙනු ඇත. කරුණාකර ඔබ එන්නත ලබා ගන්නා අවස්ථාවේදී ප්‍රජා එන්නත් කිරීමේ මධ්‍යස්ථානය වෙත පෙන්වීමට එම තහවුරු කිරීමේ දැන්වීම හෝ කෙටි පණිවිඩය සුරක්ෂිතව තබා ගන්න. | After a successful booking, the website will display a confirmation notice. You will also receive an SMS notification. Please save the confirmation notice or SMS to show at the Community Vaccination Centre when you receive your vaccination. |
| 4. | වයස්ගත පුද්ගලයින්ට හෝ විශේෂ සහය අවශ්‍ය පුද්ගලයින් හට වේලාව වෙන්කරවා ගැනීම සඳහා සහය පිණිස, තම ප්‍රදේශයේ තැපැල් කාර්යාලයට හෝ පොදු වතු නිවාසයන්හි නම්, එය අයත් කළමනාකරණ කාර්යාලයට යා හැකිය. | Elderly people or people requiring special help with their booking can go to a post office or the management office of the public housing estate where they live for assistance. |
| 5. | එන්නත ලබා ගැනීමට නියමිත දිනයේදී, කරුණාකර ඔබගේ හැඳුනුම්පත සහ ප්‍රමුඛතා කණ්ඩායම් සාක්ෂි සමග තෝරාගත් ප්‍රජා එන්නත් කිරීමේ මධ්‍යස්ථානයට, වෙන් කරවා ගත් වේලාවට පැමිණෙන්න. පිළිගැනීමේ | On the day of vaccination, please arrive at the chosen Community Vaccination Centre at the reserved time with your identity document and priority group proof. Show |

| | | |
|---|---|---|
| | කවුන්ටරයට ඔබගේ කෙටි පණිවුඩ දැනුම්දීම හෝ තහවුරු කිරීමේ දැන්වීම පෙන්වන්න. | your SMS notification or the confirmation notice to the reception counter staff. |
| | 38 ° C හෝ ඊට වැඩි උෂ්ණත්වයක් ඇති පුද්ගලයින් මධ්‍යයට ඇතුළු නොවිය යුතුය. | People with temperature of 38°C or higher should not enter the centre. |
| 6. | අනතුරුව, ඔබට තොරතුරු කලාපයට වෙත යා හැකිය. එහිදී තොරතුරු පත්‍රිකා කියවීමෙන්, රූපවාහිනිය නැරඹීමෙන් හෝ QR කේතය ස්කෑන් කිරීමෙන් ඔබ ලබා ගන්නා එන්නත පිළිබඳ වැඩි විස්තර දැනගත හැකිය. තොරතුරු පිරික්සීමෙන් පසුව, කරුණු පත්‍රිකාවේ ඇති කොටුව සලකුණු කිරීමෙන් එන්නත ලබා ගැනීම සඳහා ඔබේ කැමැත්ත සඳහන් කළ හැකිය. එන්නත හෝ එන්නත් කිරීම පිළිබඳව ඔබට පැහැදිළි කර ගැනීමට යමක් ඇත්නම්, කරුණාකර කාර්ය මණ්ඩලයේ සහාය ලබා ගන්න. ඔබට ඖෂධ අසාත්මිකතා හෝ බරපතල අසාත්මිකතා පිළිබඳ ඉතිහාසයක් තිබේදැයි ඔවුන් අසනු ඇත. | You may then go to the information zone, where you can understand more about the vaccine you are taking by reading the fact sheet, watching the TV or scanning the QR code. After browsing the information, you may indicate your consent to be vaccinated by ticking the box on the fact sheet. If you have any queries about the vaccine or the inoculation, please seek help from the staff. They will also ask if you have any history of drug allergies or serious allergic reactions. |

| | | |
|---|---|---|
| 7 . | එන්නත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින අතරතුර, ලියාපදිංචිය සඳහා ඔබේ හැඳුනුම්පත පිටතට ගෙන, එන්නත් කිරීමේ ක්‍රියාවලියට සහාය දැක්වීම සඳහා ඔබේ ඇඳුමේ අත ඉහළට  රෝල් කර ගැනීම සිදු කළ හැකිය. | While waiting for your inoculation, you may take out your identity card and roll up your sleeve to help with the registration and vaccination process. |
| 8. | එන්නත් කිරීමේ කුටියේදී, ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා ඔබේ හැඳුනුම්පත කාඩ්පත් රීඩර් යන්ත්‍රය තුළට ඇතුළු කරන ලෙස වෛද්‍ය කාර්ය මණ්ඩලය ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. එන්නත ලබා ගැනීමට ඔබ සුදුසු බව තහවුරු කර ගැනීමෙන් පසුව සහ ඒ සඳහා ඔබේ කැමැත්ත ලබා ගැනීමෙන් පසුව එන්නත ලබා දෙනු ඇත. | At the vaccination booth, the medical staff will ask you to insert your identity card into the card reader for registration purposes, and will administer the vaccination after confirming that you are suitable for it, and after receiving your consent. |
| 9. | ඊළඟට ඔබට ඔබේ එන්නත් කිරීමේ වාර්තාවේ පිටපතක් ලබා දෙනු ඇත. | You will then be given a copy of your vaccination record. |
| 10. | එන්නත ලබා ගැනීමෙන් පසු කරුණාකර විවේකයක් ගන්න. වෛද්‍ය කාර්ය මණ්ඩලය ඔබේ තත්වය පරීක්ෂා කරනු ඇත. ඔබ පිටවිය යුත්තේ ඔබට කිසිදු අපහසුතාවයක් නොමැති නම් පමණි. | Please take a rest after the vaccination. Medical staff will check your condition. You should leave only if you do not have any discomfort. |

| | | |
|---|---|---|
| 11. | එන්නතෙහි සම්පූර්ණ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වෙන් කළ දිනයේ දෙවන මාත්‍රාව ලබා ගැනීමට මතක තබා ගන්න. එය ඔබට සිහිපත් කිරීම සඳහා කෙටි පණිවුඩයක් එවනු ලැබේ. | Remember to receive the second dose on the reserved date in order for the vaccine to work at its full effect. An SMS alert will be sent to remind you of your appointment. |
| 12. | එන්නත් කිරීමේ මුද්‍රිත වාර්තාවට අමතරව, ඔබට eHealth සහ iAMSmart ජංගම යෙදවුම් හරහාද ඔබේ වාර්තාවට පිවිසිය හැකිය. | Apart from your paper vaccination record, you can also access your record through the eHealth and iAMSmart mobile apps. |